# අධිවේගී මාර්ගවල වාහන පැදවීමේ උපදෙස් මාලාව

අධිවේගී මාර්ගයන්හි වාහන පැදවීම ශ්‍රී ලාංකික අපට නව අත්දැකීමකි. එහි ආරක්ෂිතව වාහන පැදවීමට හා උපරිම ප්‍රයෝජන ලබාගැනීමට නම් සෑම රියදුරෙකු විසින්ම දැනගත යුතු මූලික කරුණු කිහිපයක් ඇත. එම අවශ්‍යතාවය සපුරාලීම සඳහා මෙම උපදෙස් මාලාව සකස්කර ඔබ වෙත නොමිලයේ ලබාදීමට හැකිවීම ගැන අප අවංකව සතුටු වන්නෙමු.

එම්. රණසිංහ - කළමණාකාර අධ්‍යක්ෂ

**එම්.එම්. ඕගනයිසේශන්**

*ටොයොටා අමතර කොටස් සඳහා ඔබගේ සහකරු*

**1. අධිවේගී මාර්ගයක රිය පැදවීමට තීරණය කිරීමට ප්‍රථම**

ඔබගේ වාහනය අධිවේගී මාර්ගයක ධාවනයට සුදුසු තත්ත්වයේ පවතින්නේදැයි තහවුරු කර ගත යුතුය. විශේෂයෙන් ඔබගේ වාහනයේ එන්ජිම, තිරිංග පද්ධතිය (Brakes) ප්‍රධාන ආලෝක පහන් (Head Lights) පැති සංඥා පහන් (Signal Lights) පිස්නාව (Wiper Blades) කණ්නාඩි (Rear view and side mirrors) ටයර් පරීක්ෂාකර බැලිය යුතුය. **උදා-** අර්ධ වශයෙන් ගෙවීගිය ටයර්වලින් සාමාන්‍ය මාර්ගයක ධාවනයේදී වාහනය හසුරුවාගත හැකිවිය හැකි වුවද එවැනි ටයර් වලින් අධිවේගී මාර්ගයක වාහනය පැදවීම අනතුරුදායක විය හැක.

එමෙන්ම තමන්ගේ ගමන නිමාවන තුරු වාහනය පැදවීමට අවශ්‍ය ඉන්ධන තිබේදැයි ද, අධිවේගී මාර්ග ගාස්තු ගෙවීමට ඔබ ලඟ මුදල් තිබේදැයිද පරීක්ෂාකර බලන්න.

**2. අධිවේගී මාර්ගයට පිවිසීම**

අධිවේගී මාර්ගයට පිවිසුනු විගස එහි ගමන් ගන්නා අනිකුත් වාහනවල වේගය නිශ්චය කර ආරක්ෂිත ගමනක් යාම සඳහා එම වාහනවල ධාවන වේගයට සමාන වේගයකින් තම වාහනය ධාවනය කරන්න.

**3. වාහනයේ කණ්නාඩි භාවිතා කරන්න.**

වාහනය ඇතුලත පිහිටි පිටුපස බලන කණ්නාඩිය සහ පැති කණ්නාඩි අධිවේගී මාර්ගයන්හි වාහන ධාවනය සඳහා අතිශයින් වැදගත්ය. අධිවේගී මාර්ගයට පිවිසීමට මෙන්ම වෙනත් වාහනයක් පසුකර යාමට ධාවන තීරු මාරුකරන සෑම අවස්ථාවකදීම සහ වම් ධාවන තීරුවට නැවත පිවිසෙන විට මෙම කණ්නාඩි භාවිතය අත්‍යවශ්‍ය වේ.

**4. නොපෙනන ස්ථාන (Blind Spots) පරීක්ෂාකරන්න**

ඔබගේ වාහනය අසලම පවතින නමුත් කණ්නාඩිවලින් නොපෙනෙන

ස්ථානයක් තිබේ. වේගයෙන් වාහන පැදවීමේදී ධාවන තීරු මාරුකරන විට එම නොපෙනෙන ස්ථාන බලාගැනීම සඳහා උරහිසට ඉහළින් එබී බලා පරීක්ෂා කිරීමට අමතක නොකරන්න.

5. **වේගසීමාව තරයේ පිළිපදින්න**

අධිවේගී මාර්ගවල වේග සීමාව නිරන්තරයෙන් කි.මී. 100 නොවේ. මාර්ගයේ ඇතැම් ස්ථානවල වේග සීමාව අඩු අගයක් ගනී. මාර්ගය අලුත්වැඩියා කරන අවස්ථාවල, අනතුරට භාජනය වූ වාහනයක් ඉවත්කරන කාල සීමාව තුල, වැසි දිනයන්වල වේගය අඩුකිරීමට අභිනව වේග සීමාවන් පනවා තිබිය හැකිය. එමනිසා සැමවිට වේග සීමා වෙනස්කම් දක්වන සංඥා පුවරු ගැන විමසිල්ලෙන් වාහනය ධාවනය කරන්න. එමෙන්ම වේග සීමාව ඉක්මවා වාහනය ධාවනය වන්නේද යැයි විමසීමට නිරන්තරයෙන් වාහනයේ වේග මාපකය (Speedo Meter) පරීක්ෂා කරන්න.

6. **වම් තීරුවේ ධාවනය කරන්න**

සෙමින් ඉදිරියට යන වාහන පසුකර නොයන්නේ නම් වම් ධාවන තීරුවේ වාහනය ධාවනය කල යුතුය.

7. **වාහන පසුකර යාම (overtaking)**

වම් තීරුවේ සෙමින් ධාවනය වන රථයක් පසුකර යාමට අවශ්‍ය නම් කණ්නාඩිවලින් පිටුපස හා දකුණු පස බලා නිසි සැලකිල්ලෙන් යුතුව සංඥා දමා ආරක්ෂිත ලෙස දකුණ ධාවන තීරුවට අවතීර්ණ වන්න. ඉන්පසුව එම රථය පසුකල විගස නැවත අවශ්‍ය පරතරය ලබාගෙන හැකි ඉක්මනින් සංඥා දමා ආරක්ෂිත ලෙස වම් ධාවන තීරුවට පිවිසෙන්න. දිගටම දකුණු තීරුවේ ගමන් කලහොත් ඔබට දඩකොළයක් ලැබිය හැක.

8. **වාහන අතර පරතරය පවත්වා ගැනීම**

වාහන අධිවේගයෙන් ධාවනය වන බැවින් හදිසියේ වාහනය නතර කර ගැනීමට හැකිවන ලෙසින් ඉදිරිපස වාහනය අතර පරතරයක් තබා ගැනීම ඉතා වැදගත්ය. ඔබ කි.මී. 100 ක වේගයෙන් වාහනය ධාවනය කරන්නේ නම් ඉදිරියෙන් ඇදෙන වාහනය අතර අවම වශයෙන් මීටර 100 ක පරතරයක්වත් තබාගත යුතුය. මේ සඳහා තත්පර දෙකේ රීතිය අනුමනය කරන්න.

***තත්පර දෙකේ රීතිය***

මෙම රීතිය ඔබේ වාහනය සඳහා නිසි පරතරය ලබාගැනීම සඳහා යොදාගත හැකි පහසු ක්‍රමයකි. මාර්ගයේ දක්නට ලැබෙන ලාම්පු කණුවක් හෝ පාලමක් වැනි ස්ථාවර ලක්ෂයක් තෝරා ගන්න. ඉදිරියෙන් ගමන් කරන වාහනයක් එය පසුකර යනවාත් සමඟ තත්පර දෙකක් ගණින්න. ඔබ ගැනීම අවසන් කරනවාත් සමඟ එම තෝරාගත් ලක්ෂයට ආසන්න වන්නේ නම් අවශ්‍ය අවම පරතරය ඔබ ලබාගෙන ඇත. වැසි

සහිත හෝ ලිස්සන සුළු තත්වයන්හිදී ඊට වඩා දුර පරතරයක් තබාග ැනීමට සිදුවන බව මතක තබා ගන්න.

**9. වාහනය ක්‍රියාවිරහිත වුවහොත්**

වාහනය හැකි ඉක්මනින් වම් තීරුව අසලින් ඇති හදිසි නැවතුම් තීරුවට රැගෙන ගොස් අවධානම් සංඥා පහන් ක්‍රියාත්මක කර (Hazard Lights) වාහනය නතර කරන්න.

ආරක්ෂිතව වාහනයෙන් ගොඩබැස පාර දෙපස ඇති හදිසි දුරකථන භාවිතා කර ආපදා සහය සඳහා අමතන්න. එසේ නැත්නම් ඔබගේ ජංගම දුරකථනයෙන් 1969 අමතන්න.

**10. වාහනය පදවන විට ජංගම දුරකථන භාවිතයෙන් වලකින්න**

වාහන පදවන විට ජංගම දුරකථන භාවිතය දඬුවම් ලැබිය හැකි වරදකි. ඔබේ ආරක්ෂාව පිණිස දුරකථනය අතට නොගෙන (Hands Free) කථාකරන ක්‍රමයක් භාවිතා කල ද සුළුවෙන් හෝ අවධානය කඩවීමක් සිදුවුවහොත් බරපතල අනතුරක් සිදුවීමට අවස්ථාව ඇති බැවින් අධිවේග මාර්ගයේ එසේ දුරකථන භාවිතා කිරීම වුවද නොකරන්නේ නම් වඩා හොඳ බව මතක තබා ගන්න.

**11. අධිවේගී මාර්ගයෙන් ආරක්ෂිතව පිටවන්න**

ඔබගේ ගමන සැලසුම් කර ගමනාන්තය ගැන අවධානයෙන් ධාවනය කරමින් පිටවුම් දැන්වීම් පුවරු (Exit Boards) ගැන විමසිලිමත්ව වාහනය පදවන්න. එමගින් ගමනාන්තයේ පිටවුම් මාර්ගය නිසි ලෙස දැනගැනීමට හැකිවන අතර ආරක්ෂිතව පිටවුම් තීරුවට වාහනය පැදවීමට පහසුවනු ඇත. පිටවුම් තීරුව පසුකර ගියහොත් ආපසු හැරී ආ නොහැකි බැවින් අනෙක් පිටවුම් මාර්ගය දක්වා වාහනය පැදවීමට සිදුවනු ඇත. එමඟින් ඔබගේ කාලය හා මුදල් අපතේ යනු ඇත.

**12. ආසන පටි**

වාහනයේ රියදුරු පමණක් නොව ඉදිරිපස අසුනේ මෙන්ම පිටුපසු අසුන්වල ඉදගෙන සිටින සියලු දෙනාම ආසන පටි පැලඳ සිටීම සැමගේම ආරක්ෂාව සඳහා යෝග්‍ය වේ.

**13. ළමයින්ගේ ආරක්ෂාව**

වාහනවල ඇති ආසන පටි මඟින් ළදරුවන්ට හා කුඩා දරුවන්ට ආරක්ෂාව දිය නොහැක. එමනිසා විශේෂයෙන් එවැනි අය ඉදිරිපස අසුනේ වාඩි කරවාගෙන යා නොයුතුය. එවැනි අයෙකු වැඩිමහල් අයෙකුගේ ඔඩොක්කුවේ තබාගෙන වුවද ඉදිරිපස අසුනේ රැගෙන නොයායුතුය. ඔවුන් රැගෙන යායුත්තේ පසුපස ආසනවල පමණි. බටහිර රටවල හා වෙනත් දියුණු රටවල එවැනි දරුවන් ගෙන යා හැක්කේ ඔවුන් වෙනුවෙන් සුවිශේෂයෙන් සාදා ඇති දරුවන්ගේ ආසනයක් (Baby Seat) පසුපස අසුනක සවිකරගෙන පමණි. එසේ නොමැතිව රැගෙන

යන දරුවන් අධිවේගී මාර්ගයක ඇති විය හැකි අනතුරකදී බරපතල ලෙස හානි සිදුවීමට ඇති ඉඩකඩ වැඩිය.

**14. සෙරප්පු පැළඳ වාහන පැදවීම**

සෙරප්පු ලිස්සා යාමට හෝ කකුලේ පැටලවීමට ඉඩකඩ ඇති බැවින් සෙරෙප්පු පැළඳ අධිවේගී මාර්ගයේ වාහන පැදවීම අනතුරුදායක විය හැකි බැවින් ඒ වෙනුවට සපත්තු පැළඳ වාහන පැදවීම වඩා යෝග්‍යය.

**15. ඡායාරූප**

ඔබ අධිවේගී මාර්ගයේ ධාවනය කරන විට ඡායාරූප ගැනීමෙන් වලකින්න. අධිවේගී මාර්ගයන්හි හදිසි නැවතුම භාවිතා කල හැක්කේ හදිසි අවස්ථාවන්හිදී පමණි. අතරමග වාහනය නවතා ඡායාරූප ගැනීම හෝ ස්වයං ඡායාරූප (Selfie) ගැනීමෙන් වළකින්න. එය අනතුරුදායක විය හැක.

**පුදුමයට පත් නොවන්න.**

ආරක්ෂක කැමරා හා පොලිස් විමර්ෂණ වලින් ලබා ගන්නා තොරතුරු මඟින් ඔබ යම් මාර්ග නීතියක් කඩකර ඇත්නම් ඒ බව සියලුම පිටවන දොරටුවල සිටින පොලිස් නිලධාරීන්ව දැනුවත් කරනු ලැබේ. එමනිසා පිටවුම් දොරටුවේදී දඩ කොලයක් ලැබෙනතෙක් ඔබ කිසියම් මාර්ග නීතියක් උල්ලංඝනය කර තිබේදැයි ඔබ නොදැන සිටිය හැක. එමනිසා මාර්ග නීති අකුරට පිළිපදිමින් ආරක්ෂිතව අධිවේගී මාර්ගවල වාහන පදවන්න.

***ආරක්ෂාකාරී ගමනකට අප සුභ පතන්නෙමු***

**එම්. රණසිංහ**
කළමනාකාර අධ්‍යක්ෂක

**එම්.එම්. ඕගනයිසේශන්**

***ටොයෝටා අමතර කොටස් මිලදී ගැනීමට පංචිකාවත්තට පැමිණිය යුතු නොවේ. ඔබ කල යුත්තේ අප ඇමතීම පමණි***

**0773 787 878 / 0714 725 236**